# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27
# දරන නීති ආධාර පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 6 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 ජූලි මස 14 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 60 යි

තැපැල් ගාස්තුව ශත 15 යි

(උ) අවබෝධය ඇති කිරීමේ අභිප්‍රාය ඇතිව—

(i) නීති ආධාර යෝජනා ක්‍රමයක අවශ්‍යතාව පිළිබඳව සහ එය පවත්වා ගෙනයාමේ දී සහ එයට සහභාගි වීමේ දී ස්වකීය බැඳීම් හා කාර්ය පිළිබඳව නීති වෘත්තියේ සාමාජිකයන් විසින් ද ;

(ii) ශ්‍රී ලංකාවේ නීති යටතේ ස්වකීය අයිතිවාසිකම්, බල තල, වරප්‍රසාද හා කාර්ය සම්බන්ධයෙන් විශේෂ අවශ්‍යතාවන් ඇති මහජනතාව විසින් ද

අධ්‍යාපනික වැඩ සටහන් ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම ;

(එ) නීති ආධාර සැපයීමෙහි ලා වූ යම් අංශයක් සම්බන්ධයෙන් පර්යේෂණාත්මක වැඩ සටහන්, නීති ගැටළු මධ්‍යස්ථාන සහ ව්‍යාපෘති පිහිටුවීම, පාලනය කිරීම, සංවර්ධනය කිරීම සහ ඒවාට සහයෝගය දැක්වීම සහ ඒ කාර්ය සඳහා වැඩ සටහන් සහ ව්‍යාපෘති ඇති කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සේව යෙහි නියුක්ත කිරීම ;

(ඒ) අලුත් වැඩ සටහන් සහ ව්‍යාපෘති සඳහා මහජනයාගෙන් යෝජනා ලබාගැනීම සහ ඒ සම්බන්ධයෙන් ඔවුන් . දිරි ගැන්වීම ;

(ඔ) නීති ආධාර ලබා දෙන්නා වූ තැනැත්තන්ගේ අධ්‍යාපනය සහ ඔවුන් පුහුණු කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපනික ආයතන හා මණ්ඩල සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඕ) නීති ආධාර ලබා ගැනීමේ හැකිකම පිළිබඳව මහජනයාට තොරතුරු සැපයීම ;

(ක) ශ්‍රී ලංකාවේ හා පිටරටවල නීති ප්‍රතිසංස්කරණ නියෝජිතායතනවලට හා රජයට කරුණු ඉදිරිපත් කිරීම ;

(ග) කොමිෂන් සභාව විසින් කරනු ලැබූ වැඩ පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුව වෙත වාර්ෂික වාර්තාවක් සහ අමාත්‍ය වරයා වෙත සහ නීති ආධාර උපදේශක මණ්ඩලය වෙත අතුරු වාර්තා ඉදිරිපත් කිරීම ;

(ච) මේ පනතේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ අරමුණු මුදුන්පත් කර ගැනීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යම් තැනැත්තන් සේවයෙහි නියුක්ත කර ගැනීම හා සියලු ක්‍රියා කිරීම ;

(ජ) යම් චංචල හෝ නිශ්චල දේපළක් සතුව සිටීම, මිල දී ගැනීම, අන් සතු කිරීම හෝ උකස් කිරීම.

කොමිෂන් සභාවේ සංයුතිය.

5. කොමිෂන් සභාව සාමාජිකයන් නව දෙනකුගෙන් සමන්විත විය යුතු අතර ඔවුන් අතුරින්—

(අ) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් තුන් දෙනකු අමාත්‍ය වරයා විසින් පත් කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) (මෙහි මින් මතු "නම් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හය දෙනකු ශ්‍රී ලංකාවේ නීතිඥ සංගමය විසින් ස්වකීය සාමාජිකයන් අතුරින් නම් කරනු ලැබිය යුතු ය.

පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය.

6. (1) සෑම පත් කළ සාමාජිකයකු ම, අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(2) පත් කළ සාමාජිකයන් අතර ඇතිවන යම් අනියම් පුරප්පාඩු වක් පිරවීම පිණිස අමාත්‍යවරයා විසින් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තකු තමා අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවෙන් ද, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ඔහු ධුරය දැරිය යුතු ය.

නම් කළ සාමාජිකයන්ගේ ධුර කාලය.

7. (1) කොමිෂන් සභාව පිහිටුවනු ලැබීමෙන් ඉක්බිතිව ම නීතිඥ සංගමය විසින් නම් කරනු ලැබූ සාමාජිකයන් හයදෙනාගෙන්, පළමු අවුරුද්ද අවසානයේ දී සාමාජිකයන් දෙදෙනකු ද, දෙවන අවුරුද්ද අවසානයේ දී සාමාජිකයන් දෙදෙනකු ද ධුරය හිස් කළ යුතු ය. ඒ එක් එක් අවුරුද්ද අවසානයේ දී කවර සාමාජිකයන් දෙදෙනා ධුරය හිස් කළ යුතු ද යන වග නිශ්චය කිරීම, නීතිඥ සංගමය විසින් තීරණය කරනු ලැබූ ආකාරයට, නීති ආධාර යෝජනා ක්‍රමයේ පරිපාලක ලෙස 12 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයා නම් කරනු ලැබූ සාමාජිකයකු නම් ඔහු හැර අනෙක් සාමාජිකයන් අතර කුසපත් ඇදීමෙන් කරනු ලැබිය යුතු ය. එම නිශ්චය කිරීම නීතිඥ සංගමය විසින් වහාම කොමිෂන් සභාව වෙත දන්වා එවිය යුතු ය. ඉතිරි සාමාජිකයන් දෙදෙනා තුන්වන අවුරුද්ද අවසානයේ දී ධුරය හිස් කළ යුතු ය.

(2) ඒ එක් එක් අවුරුද්ද අවසානයේ දී ඇතිවන පුරප්පාඩු පිරවීම පිණිස එහි සාමාජිකයන් අතුරින් තැනැත්තන් දෙදෙනකු නීතිඥ සංගමය විසින් නම් කළ යුතු අතර, එසේ නම් කරනු ලැබූ සෑම තැනැත්තකු ම ඉනික්බිති අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(3) නම් කරනු ලැබූ සාමාජිකයන් අතර අනියම් පුරප්පාඩුවක් ඇති වූ කවර හෝ විටක, නීතිඥ සංගමය විසින් ස්වකීය සාමාජික යන් අතුරින් තැනැත්තකු ඒ පුරප්පාඩුව පිරවීම පිණිස නම් කරනු ලැබිය යුතු ය. යම් අනියම් පුරප්පාඩුවක් පිරවීම පිණිස නම් කරනු ලැබූ යම් තැනැත්තකු, තමා අනුප්‍රාප්ත වන්නේ යම් සාමා ජිකයකු වෙනුවෙන් ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරිය යුතු අතර, (2) වන උපවගන් තියේ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා එම සාමාජිකයා වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(4) ධුරය හිස් කරනු ලබන සෑම නම් කළ සාමාජිකයකු ම, නැවත නම් කරනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

පුරප්පාඩුවක් ඇත ද කොමිෂන් සභාවට ක්‍රියා කළ හැකි බව.

8. කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් ඇත ද කොමිෂන් සභාවට ක්‍රියා කළ හැකි ය.

කොමිෂන් සභාවේ සභාපති.

9. කොමිෂන් සභාව විසින්, නීතිඥ මණ්ඩලයේ අවුරුදු පහකට නොඅඩු කාලයක් කටයුතු කර ඇති නීතිඥවරයකු වූ සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් එක් අවුරුද්දක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතු ය. ඒ සාමාජිකයා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

කොමිෂන් සභාවේ රැස්වීම්වල ගණපූරණය සහ කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම.

10. (අ) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(ආ) රැස්වීම්වල කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබූ යම් නියෝගවලට යටත්ව රැස්වීම්වල හා ඒ රැස්වීම්වල කටයුතු පිළිබඳව ස්වකීය කාර්ය පටිපාටිය කොමිෂන් සභාව විසින් විධිමත් කරනු ලැබිය යුතු ය.

සාමාජිකයකු විසින් ධුරය හිස් කිරීම.

11. (1) යම් සාමාජිකයකුට—

(අ) ඔහු පත් කළ සාමාජිකයකු නම් අමාත්‍යවරයා වෙත; සහ

(ආ) ඔහු නම් කළ සාමාජිකයකු නම් ශ්‍රී ලංකාවේ නීතිඥ සම්මේලනයේ සභාපතිවරයා වෙත

අමතනු ලැබූ ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) නම් කළ සාමාජිකයකු, නීතිඥ සංගමයේ සාමාජිකයකුව සිටීම අවසන් කිරීමේ දී, ස්වකීය ධුරය හිස් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (අ) තමා විසින් පත් කරනු ලැබූ සාමාජිකයකු ඉවත් කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා කල්පනා කරන්නේ නම් අමාත්‍යවරයා විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(ආ) නම් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් පිළිබඳව යථා පරිදි දැනුම් දීමක් කිරීමෙන් පසු හා නීතිඥ සංගමයේ රැස්වීමකට පැමිණ සිටිනු සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක වැඩි ඡන්දයකින් එය සම්මත කර යම් නම් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

නීති ආධාර යෝජනා ක්‍රමයේ පරිපාලක.

12. (1) කොමිෂන් සභාව සුදුසු යයි සලකන යම් නියම, කාර්යාල වේලා හා අධීක්ෂණ විධි හා වෙනත් කොන්දේසි මත නීති ආධාර යෝජනා ක්‍රමයේ පරිපාලක වශයෙන් එහි සාමාජිකයන් අතුරින් යම් සාමාජිකයකු අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ප්‍රමාණ මත ඒ පරිපාලකට නීති ආධාර අරමුදලෙන් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් කලින් කල දෙනු ලැබිය හැකි යම් විධානවලට පරිපාලක යටත් විය යුතු ය.

(4) පරිපාලක වෙනුවට වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු යයි කොමිෂන් සභාවේ ඉතුරු සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට අඩු නොවන සංඛ්‍යාවක් විසින් තීරණය කරනු ලබන්නේ නම් මිස, පරිපාලක කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටින තාක් කල් ධුරය දැරිය යුතු ය.

නීතිඥ සංගමය විසින් කොමිෂන් සභාවට උපදෙස් දෙනු ලැබිය හැකි බව.

13. කොමිෂන් සභාවේ බලතල, කටයුතු හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී නීතිඥ සංගමය විසින් කලින් කල දෙනු ලබන උපදෙස්වලට කොමිෂන් සභාව යටත් විය යුතු අතර, ඒ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

නීති ආධාර උපදේශක මණ්ඩලය.

14. (මෙහි මින් මතු "උපදේශක මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) නීති ආධාර උපදේශක මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන, එහි සභාපතිවරයා විය යුතු ශ්‍රී ලංකාවේ අග්‍ර විනිශ්චයකාරවරයා හා වෙනත් සාමාජිකයන් තිස් දෙනකුගෙන් සමන්විත මණ්ඩලයක් විය යුතු ය. ඒ සාමාජිකයන් තිස්දෙනාගෙන්—

(i) සාමාජිකයන් නව දෙනෙක් කොමිෂන් සභාවේ සාමාජිකයන් විය යුතු ය;

(ii) සාමාජිකයන් තුන් දෙනෙක් ශ්‍රී ලංකාවේ නීතිඥ සම්මේලනය විසින් නම් කරන ලද සාමාජිකයන් විය යුතු ය;

(iii) සාමාජිකයන් හය දෙනෙක් අධිකරණය නියෝජනය කිරීමට අග්‍ර විනිශ්චයකාරවරයා විසින් නම් කරන ලද සාමාජිකයන් විය යුතු ය; සහ

(iv) සාමාජිකයන් දොළොස් දෙනෙක් අමාත්‍යවරයා විසින් පහත සඳහන් ආයතන සියල්ල හෝ ඉන් කිසිවක් එනම්, ආණ්ඩුව හා පළාත් පාලන ආයතන, අධ්‍යාපනික ආයතන හා නීති ආධාර සැපයීමේ යම් අංශයක් කෙරෙහි සම්බන්ධතාවක් ඇත්තා වූ ප්‍රජා, අසල්වැසි, වෘත්තීය, සමාජයීය හා වෙනත් කණ්ඩායම් නියෝජනය කිරීමට නම් කරන ලද සාමාජිකයන් විය යුතු ය.

උපදේශක මණ්ඩලයේ බලතල හා කටයුතු.

15. උපදේශක මණ්ඩලයට—

(අ) කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන සියලු වාර්තා පරීක්ෂා කිරීමට හා ඒ පිළිබඳව අදහස් දැක්වීමට;

(ආ) නීති ආධාර සේවා සැපයීම, එහි ස්වභාවය, විෂය සීමාව හා ප්‍රමාණය පිළිබඳව අමාත්‍යවරයාට හා කොමිෂන් සභාවට සාමාන්‍යයෙන් උපදෙස් දීමට;

(ඈ) අමාත්‍යවරයා හෝ කොමිෂන් සභාව විසින් මණ්ඩලය වෙත උපදෙස් සඳහා යොමු කරනු ලැබිය හැකි වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් උපදෙස් දීමට

බලය තිබිය යුතු ය.

16. (1) උපදේශක මණ්ඩලය රැස්වීම අවශ්‍ය වන සෑම විට ම හා යටත් පිරිසෙයින් මාස හයකට එක් වරක් හෝ එම මණ්ඩලය රැස්විය යුතු ය. උපදේශක මණ්ඩලයේ රැස්වීම්.

(2) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පහළොස් දෙනකු විය යුතු ය.

(3) උපදේශක මණ්ඩලයේ රැස්වීම් පරිපාලක විසින් කැඳවනු ලැබිය යුතු අතර ඔහු සියලු කාර්ය සඳහා මණ්ඩලයේ ලේකම් වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(4) උපදේශක මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය. ඒ සම්බන්ධයෙන් සාදනු ලබන යම් නියෝගවලට යටත්ව, එම මණ්ඩලය විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

17. (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "නීති ආධාර අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර කොමිෂන් සභාව විසින් කලින් කල දෙනු ලබන විධානවලට අනුකූලව කොමිෂන් සභාව විසින් අරමුදල කළමනාකරණය කිරීම, පාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතු ය. නීති ආධාර අරමුදල.

18. කොමිෂන් සභාවේ පරමාර්ථ හා අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරනු ලබන යම් මුදලක් ඉහත සඳහන් කාර්යය සඳහා ආණ්ඩුව විසින් ඒකාබද්ධ අරමුදලින් කොමිෂන් සභාවට ප්‍රදානය කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් කලින් කල දෙනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධාන අනුව ඒ මුදල වැය කරනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවට ආණ්ඩුව විසින් දෙනු ලබන වාර්ෂික ප්‍රදානය.

19. (අ) යම් තැනැත්තකු විසින් හෝ මණ්ඩලයක් විසින් හෝ ආණ්ඩුව විසින් හෝ කොමිෂන් සභාව වෙත දෙනු ලබන යම් ත්‍යාග හෝ මුදලින් වූ පරිත්‍යාග ; අරමුදලට කරනු ලබන ගෙවීම්.

(ආ) 18 වන වගන්තිය යටතේ ආණ්ඩුවෙන් ලැබෙන යම් ප්‍රදානයක් ;

(ඇ) ආයෝජනවලින් ලැබෙන යම් ආදායමක් හෝ කොමිෂන් සභාව වෙත ලැබෙන වෙනත් යම් මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

අරමුදලින් කරනු ලබන ගෙවීම්.

**20.** (අ) කොමිෂන් සභාව පිහිටුවීමේ ලා, පවත්වා ගෙන යාමේ ලා සහ ක්‍රියාකාරී කිරීමෙහි ලා දරන ලද සියලු වියදම් ;

(ආ) කොමිෂන් සභාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වැටුප් ;

(ඇ) කොමිෂන් සභාව විසින් සේවය ලබා ගන්නා ලද, කොමිෂන් සභාවේ නිලධරයන් හෝ සේවකයන් නොවන නීතිඥවරයන්ට ගෙවිය යුතු ගාස්තු ලෙස කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන මුදල් ;

(ඈ) කොමිෂන් සභාවේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් ගෙවීම්

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව සහ ත්‍යාගදායකයන් ඇතැම් ගාස්තුවලින් සහ බදුවලින් නිදහස් කිරීම.

**21.** (1) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දකින්, ධන බද්දකින් හෝ වෙනත් බද්දකින් කොමිෂන් සභාව නිදහස් විය යුතු ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් යම් බඩු ආනයනය කිරීම අනුමත කරනු ලැබුවහොත්, කොමිෂන් සභාව විසින් ආනයනය කරන ලද එම බඩු සඳහා යම් තීරුබද්දක් ගෙවීමෙන් කොමිෂන් සභාව නිදහස් විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් ත්‍යාගයක් වශයෙන් යම් මුදලක් කොමිෂන් සභාවට ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස කොමිෂන් සභාව සහ ඒ තැනැත්තා අතර වූ යම් ගිවිසුමක් ඇතුළත් යම් සාධන පත්‍රයක් මුද්දර ගාස්තු ගෙවීමෙන් නිදහස් විය යුතු ය.

(4) යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂය තුළ යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවට දෙන ලද යම් ත්‍යාගයක ප්‍රමාණය, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ එම තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ බදු අය කළ යුතු ආදායම ආගණනය කිරීමේ කාර්යය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදාය මෙන් අඩු කරනු ලැබිය යුතු අතර එම ත්‍යාගය ඒ පනතේ කාර්යයන් සඳහා බදු අය කළ හැකි තෑග්ගක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ සහ රේගු ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද බලාත්මක විය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය.

**22.** (1) 4 වන වගන්තිය යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ ලා, ස්වකීය කටයුතු කිරීම හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන යම් නිලධරයන් සහ සේවකයන් කොමිෂන් සභාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු අතර ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කළ යුතු ය.

(2) යම් තැනැත්තකුට එක් මාසයක් සඳහා රුපියල් පන්සිය යක් ඉක්මවන වැටුපක් හෝ වෙනත් පඩිනඩි හෝ වැටුප සහ වෙනත් පඩිනඩි යන දෙකම හෝ ගෙවීම අමාත්‍යවරයාගේ අනුමත යට යටත්ව කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ ඒ පිළිබඳ විගණනය.

23. (1) කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා විධානය කරන යම් අන්දමකින් හා ආකාරයකින් ස්වකීය ගිණුම් පවත්වා ගෙන යාමට සැලැස්විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් තම පොත් එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින වන විට තුලනය කිරීමට සැලැස්විය යුතු අතර ඊළඟ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනට පෙර අය වැය පිළිබඳ ගිණුමක් ද මුලින් සඳහන් දිනය දක්වා වූ කොමිෂන් සභාවේ වත්කම් සහ බැරකම් පිළිබඳ සාරාංශයක් ඇතුළත් ශේෂ පත්‍රයක් ද පිළියෙළ කිරීමට සැලැස්විය යුතු ය. අය සහ වැය පිළිබඳ ගිණුම සහ ශේෂ පත්‍රය කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ද, අත්සන් කිරීමට කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ කොමිෂන් සභාවේ නිලධරයකු විසින් ද අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් එක් එක් වර්ෂය සඳහා වූ ස්වකීය ගිණුම් විගණකාධිපතිවරයා ලවා විගණනය කරවා ගත යුතු ය. එම ගිණුම් විගණනය කිරීමේ ලා විගණකාධිපතිවරයාට සහාය වීමේ කාර්යය සඳහා විගණකාධිපතිවරයාගේ විධාන හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු යම් සුදුසුකම් ලත් විගණකවරයකුගේ සේවය විගණකාධිපතිවරයා විසින් ලබා ගත හැකි ය.

(4) කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීමේ ලා විගණකාධිපතිවරයා විසින් දරන ලද වියදම් පියවීමේ කාර්යය සඳහා මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් කොමිෂන් සභාවේ අරමුදලින් විගණකාධිපතිවරයාට ගෙවනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවෙන් විගණකාධිපතිවරයාට ලැබුණු යම් පාරිශ්‍රමිකයක්, එම විගණනයේ කාර්යය සඳහා ඔහු විසින් සේවයෙහි නිරත කරන ලද යම් සුදුසුකම් ලත් විගණකවරයකුට ඔහු විසින් ගෙවන ලද යම් මුදලක් අඩු කර ගැනීමෙන් පසුව, ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම් ලත් විගණකවරයා" යන යෙදුමෙන්—

(අ) ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන එම ආයතනයේ සාමාජිකයකු වන යම් පුද්ගලයකු ; හෝ

(ආ) ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන එම ආයතනයේ සාමාජිකයකු වන වරලත් ගණකාධිකාරී ව්‍යාපාරික ආයතනයක එක් එක් හවුල්කරුවකු

අදහස් වේ.

(6) විගණනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි විගණකාධිපතිවරයා සලකන, කොමිෂන් සභාවේ සියලු පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර් සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ලබා ගැනීමට විගණකාධිපතිවරයාට සහ කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීමේ දී තමාට සහාය වන යම් තැනැත්තකුට හැකි විය යුතු අතර එම කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ හා තමන් දන්නා වූ තොරතුරු ද සමග ඒ සියලු පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර් සහ වෙනත් ලේඛන කොමිෂන් සභාවේ සාමාජිකයන් හෝ නිලධරයන් විසින් විගණකාධිපතිවරයාට සහ එම තැනැත්තාට සපයනු ලැබිය යුතු ය.

(7) විගණකාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ ගිණුම් පරීක්ෂා කර බැලිය යුතු අතර—

(අ) තමාට අවශ්‍ය වූ සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් තමාට ලැබී ඇත ද නැත ද යන වග ප්‍රකාශ කරමින් ;

(ආ) කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ සත්‍ය සහ පැහැදිලි තත්ත්වයක් පෙන්නුම් කරන පරිදි වාර්තාවේ දක්වා ඇති ගිණුම් නිසි පරිදි සකස් කර ඇත්තේ ද යන වග ප්‍රකාශ කරමින් ; සහ

(ඇ) කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය සහ ගිණුම් පිළිබඳ යම් පරීක්ෂණයක දී ජාතික රාජ්‍ය සභාවට, වැදගත් විය හැකි ස්වකීය මතය වන්නා වූ ගිණුම්වල සඳහන් යම් විෂයයක් කෙරෙහි අවධානය යොමු කරමින්

වාර්තාවක් ඔහු විසින් සපයනු ලැබිය යුතු ය.

(8) විගණකාධිපතිවරයා විසින් ස්වකීය වාර්තාව කොමිෂන් සභාව වෙත යැවිය යුතු ය.

වාර්ෂික වාර්තාව.

24. (1) අමාත්‍යවරයා වෙත සපයන ලද යම් තොරතුරු සහ අමාත්‍යවරයා විසින් දෙන ලද යම් විධාන ද ඇතුළත් ඉකුත් වර්ෂය තුළ කොමිෂන් සභාවේ වැඩ සහ මුදල් පිළිබඳව වූ ලිඛිත වාර්තාවක් අවුරුදු පතා කොමිෂන් සභාව විසින් සකස් කළ යුතු අතර කොමිෂන් සභාව විසින්—

(අ) එම වාර්තාවේ පිටපතක් ;

(ආ) එම වර්ෂය සම්බන්ධයෙන් වූ ද විගණකාධිපතිවරයා විසින් සහතික කරන ලද්දා වූ ද අය සහ වැය ගිණුමේ පිටපතක් සහ ශේෂ පත්‍රයේ පිටපතක් ; සහ

(ඇ) විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක්

අමාත්‍යවරයා වෙත සහ නීතිඥ සංගමය වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවල සහ ප්‍රකාශනවල පිටපත් අමාත්‍යවරයා විසින් ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

25. රජයේ ඉඩම් පිළිබඳ විෂයය තත්කාලයේ භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන කොන්දේසිවලට යටත්ව, යම් රජයේ ඉඩමක් හෝ යම් රජයේ ගොඩනැගිල්ලක්, කොමිෂන් සභාවේ කාර්යය සඳහා හෝ කොමිෂන් සභාවේ යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ පදිංචිය සඳහා කොමිෂන් සභාවේ ප්‍රයෝජනය පිණිස ලබාදීම හෝ කොමිෂන් සභාවට පවරා දීම හෝ කරනු ලැබිය හැකි ය.

රජයේ ඉඩම් සහ රජයේ ගොඩනැගිලි.

26. (1) මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය අනුව හෝ තමා විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ නියෝජිතයකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ ආයතනයක් ඉදිරියෙහි කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට විරුද්ධව හෝ පවරන ලද යම් සිවිල් නඩුවක්, අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරන ලද යම් වියදමක් කොමිෂන් සභාවේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් නඩුවක, අපරාධ නඩුවක හෝ නඩු කටයුත්තක දී කොමිෂන් සභාවට ගෙවන ලද හෝ කොමිෂන් සභාව විසින් ලබා ගන්නා ලද යම් නඩු ගාස්තු කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය අනුව හෝ (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ ආයතනයක් ඉදිරියෙහි ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් නඩුවක, අපරාධ නඩුවක හෝ නඩු කටයුත්තක දී එවැනි යම් තැනැත්තකු විසින් දරන … යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය, විනිශ්චය අධිකාරය හෝ ආයතනය තීරණය කළහොත් එම වියදම එම සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී හෝ නඩු කටයුත්තේ දී ඔහු විසින් අය කර ගනු ලබන්නේ නම් මිස, ඔහුට කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානයක් අනුව හෝ කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ආදීන් ආරක්ෂා කිරීම.

27. කොමිෂන් සභාවට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී කොමිෂන් සභාවේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ සාමාජිකයකුගේ දේපළට විරුද්ධව හෝ කිසිම ජප්ති ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ සාමාජිකයකුගේ දේපළට විරුද්ධව කිසිම ජප්ති ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු බව.

නියෝග.

**28.** (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා සාමාන්‍යයෙන් ද, නියම කළ යුතු යයි මේ පනතේ ප්‍රකාශ කරන් ලද හෝ නියම කරන ලද යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනතින් නියම කර ඇත්තේ හෝ බලය දී ඇත්තේ යම් කාරණයක් සම්බන්ධයෙන් ද ඒ කාරණය සම්බන්ධයෙන් විශේෂයෙන් ද කොමිෂන් සභාව විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ සාදන ලද කිසිම නියෝගයක්, එය අමාත්‍ය වරයා විසින් අනුමත කරනු ලැබ, ජාතික රාජ්‍ය සභාව විසින් [illegible] කරනු ලැබ හා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලා[illegible] නොවිය යුතු ය.

කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**29.** කොමිෂන් සභාවේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**30.** කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**31.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි,—

"නීතිඥ සංගමය" යන්නෙන් ශ්‍රී ලංකා නීතිඥ සම්මේලනයේ නීතිඥ සංගමය අදහස් වේ; තව ද

"ශ්‍රී ලංකා නීතිඥ සම්මේලනය" යන්නෙන් කොළඹ නීති පුස්තකාලයේ දී 1974 නොවැම්බර් මස 9 වන දින පිහිටුවන ලද හා සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා නීතිඥවරයන්ගේ සම්මේලනය අදහස් වේ.